# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි දෙවන පරීක්ෂණය (බාහිර) - 2021

2024 අගෝස්තු

මානවශාස්ත්‍ර පීඨය

## නාට්‍ය හා රංගකලාව

### ආසියානු රංග කලා සම්ප්‍රදායන් - DMAT 28224

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

**ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි.** **කාලය : පැය 03 යි.**

---

01. (අ) සංස්කෘත නාට්‍යයේ ප්‍රභවය සම්බන්ධයෙන් වන දිව්‍යමය මතය සැකෙවින් විස්තර කරන්න. (ලකුණු 08)

(ආ) දිව්‍යමය මතය හැර සංස්කෘත නාට්‍යයේ ප්‍රභවය සම්බන්ධයෙන් විද්වතුන් දක්වා ඇති මත අවම වශයෙන් ත්‍රිත්වයක්වත් නම් කර එම මත සමාලෝචනය කරන්න. (ලකුණු 12)

02. සංස්කෘත නාට්‍යයෙහි විශේෂතා පිළිබඳ නිදසුන් සහිතව අධ්‍යාපනික සඟරාවකට ලිපියක් ලියන්න. (ලකුණු 20)

03. පහත මාතෘකා දෙකක් (02) පිළිබඳව කෙටි සටහන් ලියන්න.

(අ) ඉතිවෘත්තය
(ආ) පූර්ව රංගය
(ඇ) රසසූත්‍රය
(ඈ) ප්‍රකරණ සහ නාටිකා (ලකුණු 10x2=20)

04. ''මහාභාරත වීරකාව්‍යයෙහි ඇති නීරස කතා පුවතක් වඩා විස්වසනීයත්වයකින් යුතු විශිෂ්ට නාටකයක් බවට පත් කිරීමට අභිඥානශාකුන්තල නාටකයේ රචකයා සමත් වී ඇත.'' මේ මතය නිදසුන් සහිතව විමර්ශනය කරන්න. (ලකුණු 20)

05. (අ) විකෘෂ්ට ප්‍රේක්ෂාගෘහයක් ඇඳ කොටස් නම් කරන්න. (ලකුණු 10)

(ආ) ප්‍රේක්ෂාගෘහයක කොටස් පිළිබඳ සැකෙවින් විස්තර කරන්න. (ලකුණු 10)

06. (අ) ජපානය තුළ නාට්‍ය සම්ප්‍රදායක් ඇතිවීම සඳහා බලපෑ සාධක නිදසුන් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 08)

(ආ) රංග ශාලාව, රංග ශෛලිය කෙරෙහි සිදු කරන බලපෑම ''නෝ'' නාට්‍ය හෝ ''කබුකි'' නාට්‍ය ඇසුරින් විග්‍රහ කරන්න. (ලකුණු 12)

07. නෝ නාට්‍ය කෘති දෙකක් තෝරාගෙන අදාළ කෘති මගින් ප්‍රකට කෙරෙන නාට්‍ය රචකයාගේ දෘෂ්ටිය කෙරෙහි බුදු දහම බලපා ඇති ආකාරය පෙන්වා දෙන්න. (ලකුණු 20)

08. (අ) බෙයිජිං ඔපෙරාවේ (Beijing Opera) චරිත වර්ග (Types of roles) හඳුන්වා දෙන්න. (ලකුණු 04)

(ආ) බෙයිජිං ඔපෙරාවේ රූපණ කාර්යය පැහැදිලි කරන්න. (ලකුණු 16)

****************************